අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගය 2023 (2024)
கல்விப் பொதுத் தராதரப் பத்திர (சாதாரண தர)ப் பரீட்சை, 2023 (2024)
General Certificate of Education (Ord.Level) Examination, 2023(2024)

සිංහල භාෂාව හා සාහිත්‍යය I, II
சிங்களமொழியும் இலக்கியமும் I, II
Sinhala Language and Literature, I, II

## සිංහල භාෂාව හා සාහිත්‍යය II

- ප්‍රශ්න සියල්ලට ම උත්තර සපයන්න. මෙම ප්‍රශ්න පත්‍රයට නියමිත ලකුණු ගණන 80කි.

1. (i) සිට (x) තෙක් ඇති **සියලු ම** අනුකොටස්වලට කෙටි උත්තර ලියන්න. කිසියම් අනුකොටසකට ඔබ උත්තර **නොලියන්නේ නම්, එහි අංකය ලියා ඉදිරියෙන් ඉරක් අඳින්න.**

(i) පහත සඳහන් වාක්‍යයේ ඇතුළත් **ඝෝෂ මහප්‍රාණ** අක්ෂර සහිත වචන දෙකක් ලියන්න.
"පාසලේ සංවර්ධනයට ප්‍රතිඵල පමණක් ම නොව සිසු විනය ද බලපාන බව අභිනවයෙන් පත්ව ආ විදුහල්පතිතුමිය රැස්වීම පවත්වන අවස්ථාවේ දී පැවසුවා ය."

(ii) පහත සඳහන් වාක්‍යයේ ඇතුළත් **උපසර්ග** යෙදුණු නාම පද දෙකක් ලියන්න.
"මනුෂ්‍යයන් ප්‍රයත්න දැරිය යුත්තේ අහිංසක සත්වයන් විපතින් මුදවා සහකම්පනයෙන් පිරි ලොවක් බිහි කිරීමට ය."

(iii) පහත සඳහන් විසන්ධි පද නිවැරදි ව සන්ධි කරන්න.
(අ) සන්ධි + අක්ෂර
(ආ) සත් + දිනක්

(iv) පහත සඳහන් වාක්‍යයේ වචන දෙකක අක්ෂර වින්‍යාසය සදොස් ය. එම වචන දෙක පමණක් නිදොස් කර ලියන්න.
පැරණි සම්භාව්‍ය කෘති රචනයේ දී නිර්මාණකරුවන් උපමා භාවිතයට දැක්වූ සමර්ථය නිසා එම කෘති වර්ථමානයේ දී ද පාඨක ආකර්ෂණය දිනා ගැනීමට සමත් වෙයි.

(v) පහත සඳහන් වාක්‍යයේ ඇතුළත් විශේෂණ හා විභක්ති සමාසවලට අයත් වචන දෙකක් ලියන්න.
සුරක්ත පුෂ්පයන් මදසුළඟේ පිපී වැනෙද්දී බිඟුනද දසත පැතිරී ගියේ ය.

(vi) පහත දැක්වෙන වාක්‍ය සදොස් ය. ඒවා නිදොස් කර ලියන්න.
(අ) නියඟයට හේන් ද කුඹුරු ද පාළු වූහ.
(ආ) යහපත් ආකල්පවලින් පිරිපුන් මිනිස්සු නොමිනිස්සු සේ නො හැසිරෙති.

(vii) පහත සඳහන් අදහස්වලට ගැළපෙන තනි පදය බැගින් ලියන්න.
(අ) දෙකෙළවරක් සහිත
(ආ) මිල කළ නොහැකි

(viii) පහත සඳහන් පදවලට විරුද්ධාර්ථවත් පදය බැගින් ලියන්න.
(අ) ප්‍රවර්ධනය
(ආ) නාමික

(ix) පහත සඳහන් යෙදුම්වල පළමුවන වචනය සමග දෙවැනි වචනයේ නොගැළපීමක් ඇත. වඩාත් ගැළපෙන සේ පළමුවන වචනය හෝ දෙවැනි වචනය සකස් කර ලියන්න.
(අ) ස්වභාව දහම
(ආ) ලෝ චාරිත්‍ර

(x) පහත සඳහන් වාක්‍ය කර්තෘ කාරකයට හරවා ලියන්න
(අ) පාසල් ළමයින් විසින් පැරණි චිත්‍ර එලෙස ම අඳිනු ලබයි.
(ආ) ගුරුවරුන් විසින් නිරන්තරයෙන් අපි දිරිමත් කරනු ලැබුමු.

2. පහත දැක්වෙන (අ), (ආ), (ඉ), (ඊ) යන විස්තර අතුරෙන් **එකක්** තෝරාගෙන **වචන 250කට නො අඩු** වන සේ රචනයක් ලියන්න.

(අ) මානව බුද්ධිය අවශ්‍ය වන කාර්ය සඳහා පරිගණක පද්ධති සැකසුම වර්තමානයේ නව තාක්ෂණික ප්‍රවණතාවකි. මේ කෘත්‍රිම බුද්ධිය මිනිස් මොළයට සම වනු ඇත්ද? මානව ජීවිතයේ ප්‍රගමනයට ඉන් රුකුලක් ලැබෙනු ඇත්ද? හෝ මානව පැවැත්මට අහිතකර විපාක අත් කර දෙනු ඇත්ද? යන ප්‍රශ්න විෂය විශේෂඥයන්ගේ සාකච්ඡාවට ලක් වී ඇත. වර්තමානයේ මෙය අවධානය යොමු කළ යුතු කාලෝචිත සංකල්පයකි.

(ආ) රටක යහපැවැත්මට මෙන් ම අභිවර්ධනය උදෙසා බුද්ධිමතුන්ගේ දායකත්වය බෙහෙවින් අවශ්‍ය වේ. බුද්ධිමතුන් රට හැර යාම සමාජ අර්බුදයක් බව නොකිය මනා ය. මහජන මුදලින් අධ්‍යාපනය ලබා තම කුසලතා රටට අහිමි වීම මෙන් ම උගත්කමට සරිලන රැකියා හෝ වැටුප් ලැබීම යන කරුණු ඔස්සේ මේ ගැටලුව විග්‍රහ කළ යුතු යැයි සමාජ විද්‍යාඥයන්ගේ අදහස වී තිබේ. ඔවුන් මෙරට රඳවා ගැනීමටත් ඔවුන්ගේ බුද්ධිමය කුසලතා රටේ සංවර්ධනයට උපයෝගි කර ගැනීමටත් නිසි වැඩපිළිවෙළක් සැකසීම කාලීන අවශ්‍යතාවකි.

(ඉ) නවෝත්පාදනය වර්තමානයේ දියුණු රටවල මෙන් ම සංවර්ධනය වෙමින් පවතින රටවල ද සාකච්ඡාවට බඳුන් වන කාලීන සංකල්පයකි. නව නිපැයුම් බිහි වීම හා අපනයන වෙළෙඳ පොළ පුළුල් වීම එකිනෙක බැඳුණු සංවර්ධන අවශ්‍යතා වේ. මේ පිළිබඳ විධිමත් වැඩපිළිවෙළක් සකස් කිරීමත් එය විද්‍යානුකූලව පවත්වා ගැනීමත් ගැටලුකාරී නොවිය යුතු අතර වගකිවයුත්තන් ඒ කෙරෙහි අවධානය යොමු කළ යුතු ය.

(ඊ) වත්මන් පරපුර නව මාධ්‍ය මෙවලම්වලට වඩ වඩා සමීප වීම සහ පොත්පත් නොකියවීමත් සාහිත්‍ය සේවනයට යොමු නොවීමත් පිළිබඳ කතිකාවතක් ඇරඹීමට කාලය පැමිණ ඇත. පොත් පත් නිසා විවේක බුද්ධිය, සන්සුන් මානසික ස්වභාවය, සාහිත්‍ය රස වින්දනය ද සමාජයෙන් බැහැර වෙමින් පවතින අතර ඒ හේතුවෙන් අපරාධ වර්ධනයට ද සහකම්පනයෙන් තොර සිතුවිලි ඇති පරපුරක් බිහිවීම ද සමාජය මුහුණ දෙන නව අභියෝගයකි.

3. පහත සඳහන් පාඨය **වචන 60-70** වන සේ **සාරාංශ** කොට ලියන්න. ඔබේ සාරාංශයේ වචන සංඛ්‍යාව පිළිතුර අග සඳහන් කරන්න.

දැනට විද්‍යමාන සාධක අනුව සිංහලයේ පැරණි ම ලේඛන දක්නා ලැබෙන්නේ ක්‍රි.පූ. තෙවන සියවසේ දී ය. මේ ලිපිවල යොදා ගැනෙන බ්‍රාහ්මී හෝඩිය භාරතයෙන් ලද දායාදයක් බවත් දේවානම්පියතිස්ස (ක්‍රි.පූ. 250-210) රාජ සමයේ දී දඹදිව අශෝක අධිරාජයන්ගේ රාජ සභාව සමග පැවති සම්බන්ධතා අනුව එය මෙරටට ගෙන එන්නට ඇති බවත් ප්‍රකට ය. ක්‍රි.පූ. තුන් වන සියවසේ දී බ්‍රාහ්මී හෝඩිය සිංහලයන් විසින් භාවිතයට ගත් අවස්ථාවේ දී සිදුවූයේ මෙතෙක් කල් කථා ව්‍යවහාරගතව පැවති සිංහල භාෂාව ලේඛන මාධ්‍යයෙන් නිරූපණය කිරීම ය. එහෙයින් ක්‍රි.පූ. තෙවන සියවසේ ලිපිවල නිරූපණය වී ඇත්තේ සමකාලීන කථා ව්‍යවහාරයේ ප්‍රතිමූර්තියකැයි සැලකීම සාධාරණ වේ.

කථා ව්‍යවහාරයේ පවතින භාෂාව යුගයෙන් යුගයට වෙනස් වන බව අපි දනිමු. මෙය ඉතා සෙමෙන් සිදු වන්නක් හෙයින් එක් අයෙකුගේ ජීවිත කාලය තුළ එය ප්‍රත්‍යක්ෂ කර ගැනීම අසීරු ය. එසේ වුවද භාෂාවේ පැරණි අවස්ථා පිළිබඳ සාධක දක්නා ලැබෙන විට (සිංහලයේ ක්‍රි.පූ. තෙවන සියවසේ සිට පැවත එන සෙල්ලිපි හා ඊට අමතරව ක්‍රි.ව. 10වන සියවසේ සිට පැවත එන ලිඛිත ග්‍රන්ථ සමූහය මෙන්) භාෂාව යුගයෙන් යුගයට වෙනස් වෙමින් පැවත ආ සැටි ප්‍රත්‍යක්ෂ කර ගැනීම අසීරු නොවේ. මුලින් ම ලේඛන ව්‍යවහාරය ආරම්භ කරන අවස්ථාවෙහි සිදු වන්නේ කථා ව්‍යවහාරයෙහි පවත්නා භාෂා ස්වරූපය ලේඛන මාධ්‍යයෙන් නිරූපණය කිරීම ය. කාලයාගේ ඇවෑමෙන් කථා ව්‍යවහාරයෙහි ඇති වන වෙනස්කම් ලේඛන ව්‍යවහාරය තුළට වැද්ද ගතහොත් කලක් ගත වූ පසු ලේඛන ව්‍යවහාරය කථා ව්‍යවහාරයට වඩා පැරණි ස්වරූපයක් දරනු ඇත. එවිට භාෂා ද්විරූපතාව පහළ වේ.

4. පහත දැක්වෙන ඡේදය කියවා අසා ඇති ප්‍රශ්නවලට කෙටි පිළිතුරු සපයන්න.

සංස්කෘත කාව්‍ය යනු ආස්වාදනීය කලා මාධ්‍යයකි. ඒ කවිය තුළ රසය නොමඳ ව ලැගුම් ගෙන ඇති හෙයිනි. සංස්කෘත කාව්‍ය සාහිත්‍යයේ ශ්‍රව්‍ය කාව්‍ය - දෘශ්‍ය කාව්‍ය ආදි වශයෙන් කාව්‍ය පිළිබඳ විවිධ වර්ගීකරණයන් දක්නට ලැබේ. එහෙත් ඒ සැම ප්‍රභේදයක් ම පොදුවේ - කාව්‍ය - නමින් ම හැඳින්වේ. ඒ සැම නිර්මාණයක ම රසය ආත්මගත ව ඇති නිසා ය. ඒ රසය උපදින්නේ විවිධ භාවයන් හේතු කොට ගෙන ය. කාව්‍යයක රසෝත්පත්තිය පිළිබඳ කාව්‍ය විචාරකයන් විවිධ මත පළ කර ඇති බව ඉහත සාකච්ඡා කරන ලදි. ඔවුහු ශබ්ද රසය හා අර්ථ රසය වශයෙන් කාව්‍යයක ආත්මගත ව ඇති රසය වර්ගීකරණය කළහ. එපමණක් නොව යථෝක්ත රසයන්ගේ උත්පත්තිය සඳහා හේතු වන අලංකාර රාශියක් ද හඳුන්වා දුන්හ.

කල් යත් ම වක්‍රෝක්තිවාදය, ඖචිත්‍යවාදය වැනි ගුරුකුල සම්ප්‍රදාය බිහි විය. එමගින් කාව්‍යය සංකීර්ණ මුහුණුවරකට පත් විය. මේ නිසා මුල් කාලයේ ආකස්මික ව මෙන් කවියෙකු විසින් නිර්මාණය කළ පද වැලට කල් යත් ම කෘත්‍රිම ස්වරූපයක් ආරූඪ විය. මුල්කාලීන කවීන්ගේ කාව්‍ය නිර්මාණ අතර රස - භාව නො අඩුව තැන්පත්ව තිබිණි. එහෙත් පශ්චාත්කාලීන රචනාවන්හි කාව්‍යරීතිවලට මුල් තැන දීමක් මිස කාව්‍ය රසයට ප්‍රධාන තැනක් දුන් බවක් නොපෙනේ. පශ්චාත්කාලීන කවීන් හුදෙක් ස්වකීය භාෂා පාණ්ඩිත්‍ය ප්‍රදර්ශනයට මුල් තැන දීම මීට හේතුවයි. එහෙත් අශ්වඝෝෂ - කාලිදාස වැනි මහා කවීන්ද්‍රයන්ගේ හා දණ්ඩී - වසුබන්ධු වැනි කර්තෘවරුන්ගේ ද නිර්මාණවල රසය නො අඩුව තැන්පත් ව ඇත. ඔවුන්ගේ නිර්මාණ ඇසුරෙන් සංස්කෘත කවියේ ගැබ් වූ රසය පිළිබඳ ගවේෂණය ප්‍රස්තුතයෙහි මුඛ්‍යාභිලාෂය යි.

(i) පශ්චාත්කාලීන කාව්‍ය නිර්මාණවල රස භාවය අඩු වීමට හේතුව කුමක් ද?
(ii) කාව්‍යයේ රසය අඩු නොවූ නිර්මාණ බිහි කළ ලේඛකයෝ කවරහු ද?
(iii) කාව්‍යයෙහි අන්තර්ගත ව ඇති රස මොනවා ද?
(iv) කාව්‍ය කෘත්‍රිම ස්වරූපයක් ගැනීමට හේතුව කුමක් ද?
(v) ලේඛකයාගේ ප්‍රධාන අපේක්ෂාව ලෙස මෙහි දැක්වෙන්නේ කුමක් ද?

5. කෙරවලපිටිය ‘සියසවි’ තරුණ සංවිධානය ස්වයං රැකියා නිෂ්පාදන අලෙවි සලක් ඉදි කිරීමට හා එමගින් ස්වයං රැකියා නිෂ්පාදන මිල දී ගැනීම, අලෙවි කිරීම සහ අපනයනය කිරීම ආදි කටයුතු සැලසුම් කර තිබේ. නව නිපැයුම්වල නිරත වන තරුණ තරුණියන්ට වඩාත් යහපත් ව්‍යවසායකයන් වීමට ඉන් අවස්ථාව සැලසීම ඒ සංවිධානයේ අපේක්ෂාවයි. මේ කාර්යයට අවශ්‍ය ආයතන ගොඩනැගිල්ලක් ඉදි කිරීමට අවශ්‍ය මූල්‍ය හා භෞතික සම්පත් සම්පූර්ණ වී ඇති අතර එයට සුදුසු ඉඩම් කොටසක් ලබා ගැනීමේ අරමුණෙන් ප්‍රාදේශීය ලේකම්වරයාට ලියන **ලිපිය** සකස් කරන්න. ඔබ ඒ සංවිධානයේ ලේකම් සුදීප පූර්ණජිත් යැයි සිතන්න. (වචන 100ක් පමණ සෑහේ.)

**නැතහොත්**

මත්තුමගල ධර්මදත්ත විද්‍යාලයේ ‘පරිසර සංගමය’ පොලිතින් භාවිතය අවම කරනු පිණිස විශේෂ වැඩසටහන් සංවිධානය කරයි.

- දැනුම ලබා දීමේ හා ආකල්ප ප්‍රවර්ධනයේ දේශන
- ප්‍රදර්ශනයක්
- චිත්‍ර හා පෝස්ටර් දැක්මක්
- විකල්ප භාවිත හඳුන්වා දීමක් ආදිය ඊට ඇතුළත් වේ. මේ පිළිබඳව ජනතාව දැනුවත් කිරීම පිණිස නිර්මාණාත්මක **අත්පත්‍රිකාවක්** සකස් කරන්න.

***

අධ්‍යාපන අමාත්‍යාංශය
கல்வி அமைச்சு
Ministry of Education

21 S I, II

අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගය 2023 (2024)
கல்விப் பொதுத் தராதரப் பத்திர (சாதாரண தர)ப் பரீட்சை, 2023 (2024)
General Certificate of Education (Ord.Level) Examination, 2023(2024)

සිංහල භාෂාව හා සාහිත්‍යය III
சிங்களமொழியும் இலக்கியமும் III
Sinhala Language and Literature III

පැය දෙකයි
இரண்டு மணித்தியாலம்
Two hours

## සිංහල භාෂාව හා සාහිත්‍යය III

වැදගත් : උපදෙස් දී ඇති පරිදි ප්‍රශ්න පහකට පමණක් උත්තර සපයන්න.

- 1, 2, 3, 4 ප්‍රශ්නවලටත් 5,6,7 ප්‍රශ්නවලින් එකකටත් උත්තර සපයන්න.
  මෙම ප්‍රශ්න පත්‍රයට නියමිත ලකුණු ගණන 80කි.

01. (i) සිට (x) තෙක් ඇති සියලු ම අනුකොටස්වලට කෙටි උත්තර ලියන්න. කිසියම් අනුකොටසකට ඔබ උත්තර නොලියන්නේ නම්, එහි අංකය ලියා ඉදිරියෙන් ඉරක් අඳින්න.

(i) "තුමුල ගතින්දා
බාහු බෙලෙන්දා
වෙමි සේ **තිදසින්දා**"

(අ) මෙය කවරෙකුගේ ප්‍රකාශයක් ද?
(ආ) තද කළු අකුරින් මුද්‍රිත පදයේ අර්ථය ලියන්න.

(ii) "එ සස්තෙපුල් හා සමඟ **ඩබරායෙන් ගුළු දියක් සෙයින්** දරු නික්මිණි"

(අ) මෙයින් කියවෙන සස්තෙපුල් (සත්‍ය වචන) මොනවා ද?
(ආ) තද කළු අකුරින් මුද්‍රිත කොටසේ අන්තර්ගත උපමාවේ සරලාර්ථය ලියන්න.

(iii) මිතුරුකමින් පෙරට එතොත්
දුවිල්ලක් එක්ක වුවත්
..................................................
..................................................

(අ) ඉතිරි පාද දෙක සම්පූර්ණ කරන්න.
(ආ) මෙහි රචකයාගේ මුල් ම කාව්‍ය කෘතිය නම් කරන්න.

(iv) "මේක මට ණයට දෙන්න පුළුවන් ද? මේක විතරමයි මං ඉල්ලන්නේ"

(අ) මෙහි මේක යනුවෙන් අදහස් කරන්නේ කුමක් ද?
(ආ) මේ ප්‍රකාශය හා සම්බන්ධ අවස්ථාව ලියන්න.

(v) "රන් හැරගෙන නො දෙමි අපටත් රක්ෂාව නම් ඌ ම වෙ ද?"

(අ) මෙම ප්‍රකාශය ඇතුළත් මුල් කෘතියේ නම කුමක් ද?
(ආ) රන් හැරගෙන නොදීමට හේතුව කුමක් ද?

(vi) හිරිමල් සිනා රැළි පෙණ පිඬු මිහිරිතම
ගල් පරවල ම හැපි හැපි බිඟි කරමි මම
සම තැනිතලාවල හමු වෙයි අලසකම
නිරසයි අතරමග අවහිර නුදුටු බිම

(අ) මෙහි ඇතුළත් රූපකය උපුටා දක්වන්න.
(ආ) මේ කවියෙන් ජීවිතයට ලබා ගත හැකි පාඩම කුමක් ද?

(vii) "... පුර දියවක යහපත් දවස් සඳ බලන්නට එක් සිත් වැ එක දිසාව බලන්නවුන් පරිද්දෙන් පැදුම් දිග බලා සිටියහ"

(අ) මෙසේ බලා සිටියේ කුමක් අපේක්‍ෂාවෙන් ද?
(ආ) ඉහත පාඨය ඇතුළත් කෘතියට මූලාශ්‍රය වූ ග්‍රන්ථය නම් කරන්න.

(viii) "අයිරාවණ වුවත් නවතන රිසින් එන
අයිරා දහස් දිලි දුනු කොත් සිපත් ගෙන
කයිකාවලෙහි දැක සෙබළුන් රැක සිටින
වයි යා කරන් මල් තුරු ගන වන හිසින"

(අ) මෙම කවිය ඇතුළත් ග්‍රන්ථයෙහි රචකයා කවරෙක් ද?
(ආ) රචකයා ලියූ වෙනත් ග්‍රන්ථයක් නම් කරන්න.

(ix) "මෝඩයා තුන්මාසයක්? මොක ද කුරක්කන් අනූ දා වී වගේ ද"

(අ) මෙම පාඨය අන්තර්ගත ග්‍රන්ථය කුමක් ද?
(ආ) මේ පාඨය උපුටා ගත් ග්‍රන්ථයේ පරිවර්තකයාගේ නම සඳහන් කරන්න.

(x) (අ) සියබස්ලකර නමැති අනුවාද ග්‍රන්ථයට මුල් වූ කෘතිය කුමක් ද?
(ආ) කුස ජාතක කාව්‍යයේ රචකයා කවුද?

02.

(i) මහතෙරුන් හිඳ සස් කළ තන්හි පිළක් කළහ. **මූඪගර්භ** වූ තිරිසන්ගතියැ සත්හු දූ ඇරැ එහි හොවති. එ විගස මැ සුවයෙන් බර මුසිත්. යමක් දුර්බල ද, ගෙනැ එන්නට නොහැකි ද, ඇයට පිළ දෙවි දිය ඇරැ හිසැ ඔත් කලැ එ කෙණෙහි ම **බර මුසී**. සෙසු රෝග ද සන්හිඳි ...
(අ) මෙහි දැක්වෙන අවස්ථාව කුමක් ද?
(ආ) අංකිත පදවල අර්ථ ලියන්න.

(ii) නිමල් සඳ පහන් වැනි වැලි පිට **උදුළ**
සුපුල් මල් යහන් ලිය මඬු ලියගෙ පෙළ
එකල් කෙළන වන දෙව්ලිය දැකැ කොමළ
ළසල් රුකෙක සැතපෙව **ළපලු** සිහිලළ

(අ) මෙහි සඳහන් වන දෙවඟනන් ක්‍රීඩාවෙහි යෙදෙන ස්ථාන දෙකක් නම් කරන්න.
(ආ) අංකිත පදවල අර්ථ ලියන්න.

(iii) “ආකාශ ගංගායෙහි බිඳි-බිඳී දිවෙන්නා වූ රළපතර සේ යුද්ධයට පිඹිනා ලද කාහල ශබ්දයෙන් සතුටු වැ පැන-පැන සිටිනා වූ ග්‍රීවය ගසා සිටුවන ලද්දා වූ අස් වළල්ලකින් ද...”

(අ) මෙහි එන උපමාව හා උපමේය වෙන් කර දක්වන්න.
(ආ) කාහල ශබ්දය හා ග්‍රීවය යන පදවල අර්ථ ලියන්න.

(iv) පවන’ද පිපි තුරේය නිරතුරේ ය
කුසුමන් පෙතිතුරේය මළු තුරේ ය
අවට සුපිපි සරේය (සිරේය) බිඟු සරේ ය
සිත එවෙහෙර කෙරේය ලොබ කෙරේ ය

(අ) කැරගල විහාරය කෙරෙහි ආශාව වර්ධනය වන්නේ කුමන හේතු නිසාදැ’යි කෙටියෙන් විස්තර කරන්න.
(ආ) සුපිපි සරේය (සිරේය), බිඟු සරේය යන යෙදුම්වල අර්ථ වෙන් වෙන් ව ලියන්න.

(v) ඒකාකාර ජීවිතයත්, දැඩි උණුසුම් වාතය සමග කෙළවරක් නැති ගසුත්, කෙළවරක් නැති කම්කටොලුත් හමුවේ ඔවුන්ගේ චේතනා ශක්තියත්, කල්පනා ශක්තියත්, වේදනා ශක්තියත් විලීන ව මිය යන්නේ ය.

(අ) මෙහි සඳහන් පරිදි මානසික වෙනස සඳහා තුඩු දුන් හේතු දෙකක් දක්වන්න.
(ආ) චේතනා ශක්තිය හා විලීන ව යන පදවල අදහස ලියන්න

03. උම්මග්ග ජාතකයේ දී කතුවරයාගේ අපේක්ෂාව වී ඇත්තේ

i. බමුණු සමාජය උපහාසයට ලක්කිරීමත්
ii. රාජ්‍ය පාලනයේ නිරත රජවරුන්ගේ අදූරදර්ශීභාවය පළ කිරීමත් ය. සතර කන් මන්ත්‍රණය පාඩම ඇසුරෙන් එක් කරුණකට උදාහරණ දෙක බැගින් දෙමින් විමසන්න.

**නැතහොත්**

ගුත්තිල ඇදුරුතුමාගේ වීණා නාදයේ මිහිර වර්ණනා කරන කවියා එය රස විඳි

i. මිනිසුන්ගේ හැසිරීම
ii. සතුන්ගේ හැසිරීම් උත්කර්ෂයට නංවමින් රසිකයා අමන්දානන්දයට පත් කරයි. ගුත්තිල වෙණ නද පාඩමෙන් එක් කරුණකට උදාහරණ දෙක බැගින් දෙමින් විමසන්න.

04. සැළලිහිණි සන්දේශ කතුවරයා

i. සමකාලීන සමාජයේ ඇතැම් තොරතුරු ද

ii. අසිරිමත් වන පියසක විසිතුරු බව ද වර්ණනාවට ලක් කරයි.

නිර්දිෂ්ට පාඩම ඇසුරින් උදාහරණ දෙක බැගින් දෙමින් විස්තර කරන්න.

**නැතහොත්**

**ගැමියන් තුළ පැවති**

i. වැසිකිළි භාවිතය පිළිබඳ ආකල්පය ද

ii. රාජ්‍ය නිලධාරීන් කෙරෙහි දැක්වූ උපහාසය ද

'අපට වැසිකිළියක්' කෙටිකතාවෙන් ඉස්මතු කෙරෙන අයුරු උදාහරණ දෙක බැගින් දෙමින් පැහැදිලි කරන්න.

(ලකුණු 15 යි.)

05. 'මුනි සිරිපා සිඹීමින්නේ' පද්‍ය පන්තියේ සාර්ථකත්වයට කවියා විසින් උපයුක්ත විවිධ කාව්‍යෝපක්‍රම හේතු වී තිබේ." උචිත නිදසුන් තුනක්වත් දෙමින් විස්තර කරන්න.

(ලකුණු 10 යි.)

06. "ධ්වනිතාර්ථවත් පද යෙදීමත්, සංක්ෂිප්ත ගුණයත්, අපූරු කාව්‍යෝක්ති භාවිතයත් හේතුවෙන් ජනකවි රසවත් වී ඇත." 'කුරහන් ඉසිමුව' පද්‍ය පන්තියෙන් උචිත උදාහරණ තුනක්වත් දෙමින් විස්තර කරන්න.

(ලකුණු 10 යි.)

07. "සිංහබාහු නාට්‍යයේ රසාලිප්තභාවයට එහි ඇති තාලාත්මක භාවය හේතු වෙයි." සුදුසු උදාහරණ තුනක්වත් දෙමින් විස්තර කරන්න.

(ලකුණු 10 යි.)

අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගය 2023 (2024)

සිංහල භාෂාව හා සාහිත්‍යය

I පත්‍රය - පිළිතුරු

| ප්‍රශ්න අංකය | පිළිතුරෙහි අංකය | ප්‍රශ්න අංකය | පිළිතුරෙහි අංකය | ප්‍රශ්න අංකය | පිළිතුරෙහි අංකය | ප්‍රශ්න අංකය | පිළිතුරෙහි අංකය |
|---|---|---|---|---|---|---|---|
| 01. | **3** | 11. | **1** | 21. | **2** | 31. | **2** |
| 02. | **2** | 12. | **4** | 22. | **4** | 32. | **1** |
| 03. | **4** | 13. | **3** | 23. | **2** | 33. | **4** |
| 04. | **2** | 14. | **4** | 24. | **3** | 34. | **2** |
| 05. | **1** | 15. | **2** | 25. | **4** | 35. | **3** |
| 06. | **3** | 16. | **1** | 26. | **2** | 36. | **4** |
| 07. | **1** | 17. | **3** | 27. | **1** | 37. | **2** |
| 08. | **2** | 18. | **4** | 28. | **4** | 38. | **4** |
| 09. | **1** | 19. | **3** | 29. | **3** | 39. | **3** |
| 10. | **4** | 20. | **2** | 30. | **2** | 40. | **1** |

අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගය 2023 (2024)

සිංහල භාෂාව හා සාහිත්‍යය

II පත්‍රය - පිළිතුරු

ප්‍රශ්නය අංක 01

(i) සංවර්ධනයට
අභිනවයෙන්

(ii) ප්‍රයත්න
අහිංසක

(iii) (අ) සන්ධ්‍යක්ෂර
(ආ) සද්දිනක්

(iv) සාමර්ථ්‍යය
වර්තමාන

(v) මදසුළඟේ
බිඟුනද

(vi) (අ) නියඟයට හේන් ද කුඹුරු ද පාළු විය/ වූයේ ය.
(ආ) යහපත් ආකල්පවලින් පිරිපුන් මිනිස්සු නොමිනිසුන් සේ හැසිරෙති.

(vii) (අ) උභතෝකෝටික
(ආ) අම්ල

(viii) (අ) පරිහානිය/හායනය
(ආ) නිර්නාමික

(ix) (අ) ස්වභාව ධර්මය/ සොබාදහම
(ආ) ලෝක චාරිත්‍ර/ ලෝ සිරිත්

(x) (අ) පාසල් ළමයි පැරණි චිත්‍ර එලෙස ම අඳිති.
(ආ) ගුරුවරු නිරන්තරයෙන් අප දිරිමත් කළහ/ කළෝය.

ප්‍රශ්න අංක 02

1. මාතෘකාව හා සාරත්වත්භාවය - ලකුණු 08
උචිත මාතෘකාවක් සඳහා ලකුණු 01ක් හිමි වෙයි.
තේමාවට අදාළ බව, ඉදිරිපත් කොට ඇති ව්‍යූහයට සමීප බව, සාරවත් බව හා සමබව මෙන් ම වචන ගණන 250ට සමීප ව තිබීම යන කරුණු කෙරෙහි මෙහි දී අවධානය යොමු කෙරෙයි.

2. සංවිධානය, නිර්මාණාත්මකභාවය හා ස්වීයත්වය - ලකුණු 12
ප්‍රකාශන ශක්තිය, සංවිධානාත්මක ව කරුණු පෙළ ගැස්වීම, ස්වීයත්වය මෙන් ම ව්‍යක්ත ලේඛන ව්‍යාවහාරයකින් නිර්මාණාත්මක ප්‍රකාශනයක් වීම මෙහි දී සලකා බැලේ.

3. ශිල්පීය දක්ෂතා හා ඡේද බෙදා ලිවීම - ලකුණු 05
වියරණ, අත් අකුරු, විරාම ලක්ෂණ භාවිතය, ඡේද හා පද බෙදා ලිවීම යන අංශ කෙරෙහි සලකා බලා ලකුණු පිරිනැමේ.

(අ) කෘත්‍රිම බුද්ධියේ තාක්ෂණික බලපෑම කෙබඳුදැයි කරුණු විග්‍රහ විය යුතුයි.

(ආ) බුද්ධි ගලනය හා එහි ස්වභාවය තර්කානුකූලව විග්‍රහ විය යුතුයි.

(ඉ) නව නිපැයුම් හා අපනයන ආර්ථික සංවර්ධන අවශ්‍යතාව විවරණය වී තිබිය යුතුයි.

(ඊ) නව මාධ්‍ය මෙවලම්, පරිගණකය නිසා පොත්පත් කියවීමෙන් දුරස්ථ වීම පිළිබඳ කරුණු විග්‍රහ විය යුතුය.

ප්‍රශ්න අංක 03

සාරාංශයට ලකුණු පිරිනැමෙන්නේ,

1. අන්තර්ගතය - ලකුණු 06
2. වචන ගණන - ලකුණු 02
3. ශිල්පීය දක්ෂතා - ලකුණු 02 යන ආකාරයෙනි. (ලකුණු 10)

පහත සඳහන් කරුණු ගැන ද සැලකිලිමත් වන්න.

1. වචන ගණන 75ක් ඉක්මවූ විට මුල් වචන 70 පමණක් ඇගැයීමට ලක් කෙරේ.
2. වචන ගණන 55ට අඩු වූ විට අන්තර්ගතය පමණක් සැලකිල්ලට ගැනේ.
3. ඡේද බෙදා තිබුණොත් ශිල්පීය දක්ෂතා යටතේ ලකුණක් අඩු කෙරේ.
4. වචන සීමාව නොසලකයි නම් ලකුණක් අඩු කෙරේ.

පිළිතුරෙහි අන්තර්ගතය

1. ක්‍රි.පූ. තෙවන සියවස පමණ කාලයෙහි සිංහල ලේඛන ව්‍යවහාරය ආරම්භ වූ බව
2. එකල කථන ව්‍යවහාරය ලේඛනයට ද එක් වූ බව
3. කථන ව්‍යවහාරය සෙමෙන් වෙනස් වෙමින් පවතින බව
4. මුල් ම ලේඛන ව්‍යවහාරය කථන ව්‍යවහාරයට බොහෝ සෙයින් සමීප බව
5. කලක් ගත වන විට කථන ව්‍යවහාරයේ සිදු වන වෙනස්කම් ලේඛන ව්‍යවහාරයට එක් නොවන බව
6. භාෂා ද්විරූපතාව ඇති වන්නේ ඒ හේතුවෙන් බව

ප්‍රශ්න අංක 04

(i) කාව්‍ය රීතීවලට මුල් තැනක් දීම
(ii) අශ්වඝෝෂ, කාලිදාස, දණ්ඩි, වසුබන්ධු
(iii) ශබ්ද රසය හා අර්ථ රසය
(iv) කාව්‍යය සංකීර්ණ මුහුණුවරක් ගැනීම
(v) සංස්කෘත කාව්‍යයේ අන්තර්ගත රසය පිළිබඳ ගවේෂණය කිරීම

(ලකුණු 2X5 = 10 යි)

05. **රාජකාරි ලිපිය**

ලකුණු විග්‍රහය ⟶ 1. ආකෘතිය - ලකුණු 04
2. අන්තර්ගතය - ලකුණු 08
3. ශිල්පීය දක්ෂතා - ලකුණු 03 (ලකුණු 15)

1. ආකෘතිය යටතේ ලකුණු ලැබෙන්නේ මේ අයුරිනි.

1. යවන්නාගේ නම හා ලිපිනය - ලකුණු 01
2. ලබන්නාගේ නම සහ ලිපිනය - ලකුණු 01
3. මාතෘකාව - ලකුණු 01
4. අත්සන හා දිනය - ලකුණු 01

2. අන්තර්ගතය තුළ ලිපියේ කරුණු කෙරෙහි උචිත අයුරින් ලියැවී තිබේදැයි පරීක්ෂා කෙරේ.

3. ශිල්පීය දක්ෂතා යටතේ

නිවැරදි අක්ෂර වින්‍යාසය, උක්ත ආඛ්‍යාත පද සම්බන්ධය, පැහැදිලි අත්අකුරු, පද බෙදීමේ නිවැරදි හා සම්මත භාවිතය, විරාම ලක්ෂණ භාවිතය

- නියමිත ආකෘතිය නොමැති වූ විට අන්තර්ගතයට ලැබෙන්නේ ලකුණු තුනක් පමණි.

පිළිතුරේ අන්තර්ගතය

1. අභිනව අලෙවි සලේ ඉදිරි අපේක්ෂා - ලකුණු 02
2. අවශ්‍ය සාධක සියල්ල සැපිරී ඇති බව - ලකුණු 02
3. ඉඩම පිළිබඳ ගැටලුව පවතින බව - ලකුණු 02
4. ඒ සඳහා කරන ඉල්ලීම - ලකුණු 02

**අත් පත්‍රිකාව**

ලකුණු විග්‍රහය ⟶ 1. ආකෘතිය - ලකුණු 04
2. අන්තර්ගතය - ලකුණු 08
3. ශිල්පීය දක්ෂතා - ලකුණු 03 (ලකුණු 15)

1. ආකෘතියේ ලකුණු ලැබෙන්නේ මාතෘකාව, පළ කරන්නාගේ නම, පළ කරන දිනය හා නිර්මාණාත්මක භාවයට ය.

2. අන්තර්ගතයේ සාරවත් බව සලකා බැලේ.

3. නිවැරදි අක්ෂර වින්‍යාසය, උක්තාඛ්‍යාත පද සම්බන්ධය, පැහැදිලි අත්අකුරු, පද බෙදීමේ නිවැරදි බව හා ඡේද වෙන් කිරීම ආදිය සමස්තයක් ලෙස සලකා බලනු ලැබේ.

- නියමිත ආකෘතික ස්වභාවය නොමැති වූ විට අන්තර්ගතයට ලකුණු 03ක් හිමි වේ.

පිළිතුරේ අන්තර්ගතය

1. පොලිතින් භාවිතය අවම කිරීමට දැනුවත් කරන බව - ලකුණු 02
2. ඒ සඳහා යොදා ගෙන ඇති සංවිධානාත්මක සැලැස්ම - ලකුණු 02
3. දිනය හා ස්ථානය - ලකුණු 02
4. ඊට සහභාගි වීමේ වැදගත්කම - ලකුණු 02

අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගය 2023 (2024)
සිංහල භාෂාව හා සාහිත්‍යය
III පත්‍රය - පිළිතුරු

01. (i) (අ) සිංහබාහුගේ
(ආ) ශක්‍ර දේවේන්ද්‍රයා/ සක් දෙවිඳු

(ii) (අ) "මා ආර්ය ජාතීන් උපන් තැන් පටන් ගෙනැ-දැනැ සතක්හු දිවි නො ගැලවී නම් සසින් ... ගබට දූ සෙත් වෙව"
(ආ) දිය බඳුනකින් ජලය වැහෙන්නාක් සේ

(iii) (අ) මිතුරු වෙයන් පුතේ උඹත්
එයයි ලොවේ ගුණය මහත්
(ආ) ඔවා මුතු

(iv) (අ) දියමන්ති මාලය
(ආ) ලොයිසල් මහත්මිය තමන්ට ගැළපෙන ආභරණයක් තිබේ දැයි ෆොරෙස්ටියර් මැතිනියගේ ආභරණ පරීක්ෂා කර බලන අවස්ථාව

(v) (අ) සද්ධර්මරත්නාවලිය
(ආ) ඔහුගේ රැකියාවට ඇය සම්බන්ධ බැවින්/ ඔහු රැකෙන්නෙත් ඇයගෙන් බැවින්

(vi) (අ) හිරිමල් සිනා රැළි පෙණ පිඬු
(ආ) ජීවිතයට එළඹෙන බාධා සතුටින් භාරගත යුතු බව / බාධක නොමැති ජීවිත ගමන නීරස බව

(vii) (අ) මහෞෂධ පඬිතුමාගේ පැමිණීම
(ආ) පාලි ජාතකට්ඨ කථාව

(viii) (අ) තොටගමුවේ ශ්‍රී රාහුල හිමි
(ආ) කාව්‍යශේඛරය/ පරෙවි සන්දේශය/ පඤ්චිකා ප්‍රදීපය/ බුද්ධිප්පසාදිනිය

(ix) (අ) බැද්දේගම
(ආ) ඒ.පී. ගුණරත්න

(x) (අ) කාව්‍යාදර්ශය
(ආ) අලගියවන්න මුකවෙටි

02.(i) (අ) අංගුලිමාල තෙරුන් සත්‍ය ක්‍රියා කිරීමෙන් පසු උන්වහන්සේ වැඩ සිටි ස්ථානයේ වැදගත්කම කියැවෙන අවස්ථාව
(ආ) මුඪගර්භ - දරු ගැබ හරස් ව පිහිටි
මුසි - මිදෙයි

(ii) (අ) මල්යහන්, ලතා මණ්ඩප, ලිය ගෙපෙළ
(ආ) උදුළ - බබළන, දිදුලන
ළපලු - ළා දලු, ළපල්ලව

(iii) (අ) රළ සමූහය/ අශ්ව වළල්ල
(ආ) හොරණෑ නාදය/ බෙල්ලෙන් බෙල්ල/ බෙල්ල (ගෙල)/ ගෙලින් ගෙල

(iv) (අ) නිරන්තරයෙන් හමන සුළඟින් ගස්වල මල් පෙති මිදුල පුරා විසිරී ඇති හෙයින් සහ මී මැසි නාදය ඇසෙන මල් පිපිණු විල් ඇති හෙයින් ය.
(ආ) සුපිපි සරේය (සිරේය) - මල් පිපුණු විල්
බිඟු සරේය - මී මැසි නාදය

(v) (අ) ඒකාකාර ජීවිතය, දැඩි උණුසුම් වාතය හා අප්‍රමාණ ගස්ද, කම්කටොලු ආදිය
(ආ) චේතනා ශක්තිය - සිතීමේ හැකියාව
විලීන ව - දිය වී, දියාරු වී

03. (i) බමුණු සමාජය උපහාසයට ලක් කිරීම.

- "මහෞෂධ පඬිතුමාගේ සිතුවිලි ලෙස"
"කේවට්ටයා මා මහෞෂධ පණ්ඩිත බව නොදනිති"
"මේ කේවට්ට මහල්ලා ඇතුළු වූ අඥාන ජඩයෝ..."
"මා නිවට වූ කේවට්ටයා මා නුවණැති නියාව නොදන්නා වනැයි...."
"සාල්ලෙක ලාලා .... බාන කෙනෙකුන් මෙන් කේවට්ට බමුණා හිස වර්වස් පිඩක් හෙළා"

- වෙනත් චරිත ලවා උපහාසයට ලක් කිරීම
"කොල පවිටු දුෂ්ට අධර්මිෂ්ඨ වූ නිකෘෂ්ට අනාචාර ස්වරූප ඇති අවලක්ෂණ වූ අඥාන බමුණු මහල්ල ...."

- කතුවරයා විසින් ම උපහාසයට ලක් කරනු ලැබීම
"නැවත අඥාන වූ මහලු බමුණු කියන්නේ....."
"ඉතා ඇවිලි අවන්නා වූ නිවට වූ කේවට්ටයා කියන්නේ....."
"ඉතා අලජ්ජී වූ දුෂ්ට වූ කේවට්ටයා අසු නැඟී......"

(ii) රාජ්‍ය පාලනයේ අදූරදර්ශිභාවය

- බ්‍රහ්මදත්ත රජුගේ අදූරදර්ශි ස්වභාවයන්
"චූලනි බ්‍රහ්මදත්ත රජ්ජුරුවෝද මහත් වූ රාජ්‍ය ලෝභයෙන් යුක්ත බැවින් බමුණන්ගේ බස් අසා සතුටු ව ..."
"චූලනී බ්‍රහ්මදත්ත රජ්ජුරුවෝද කේවට්ටයන්ගේ බස් ගෙන"
"රජ්ජුරුවෝ වනාහි රාජ මානයෙන්ද ඉසුරු මදයෙන් ද මත්ව දණ්ඩකින් පහරන ලද සර්ප රාජයෙකු සේ කෝපයෙන් දිලිහි ඒ මහෞෂධයා කුමක් කෙරේ දැයි කියා"

- වෛදේහ රජුගේ අදූරදර්ශීභාවය
"වෛදේහ රජ්ජුරුවෝ වනාහි 'මේ නුවර ගන්ට එත් ල' යි පරම්පරා ශබ්දයෙන් ඇසූහ."
".... සී මැඳුරු කවුළුව හරවා පිටත බලන්නාහු උන් ආ බව දැන භයින් ත්‍රස්ත ව..."
"මෙසේ වූ මහා සේනාවෙන් අපට ගැලවීමක් කෙසේ වේ ද?"

නැතහොත්

(i) මිනිස් හැසිරීම්
- නිති නිරිඳුගේ...
- මන මත් කරවන...
- නන් දන කැන්...

(ii) සත්ව හැසිරීම්
- පිය සන් නොව...
- කන් කලු වෙණ...
- පන් සිළු වීණා...

ආදි උදාහරණ

04. (i) සමකාලීන සමාජ තොරතුරු
- හින්දු දහම රාජ්‍ය අනුග්‍රහයෙන් ප්‍රචලිත ව පැවති බව
  "ගනේ මිණි බැබළි ...."
- සපුමල් කුමරු යාපනය ජය ගැනීම
  "නිල තුරඟුට නැගෙමින් ....."
- සමකාලීන විලාසිතා
  "කස්තුරි තිලක...."

(ii) අසිරිමත් වන පෙදෙසක විසිතුරු බව

- "අග පිපි මල් මලගිය ලිය......"
- "නිමල් සඳ පහන් වැනි වැලි....."
- "වනසිරි පියුම් රා බඳ රනබරණ ....."

නැතහොත්

(i) වැසිකිළි භාවිතය පිළිබඳ ගැමි ආකල්ප
"මෙච්චර කල් නොතිබුණු කක්කුස්සියක් මොකද මේ එකපාරටම ඕනෑ වුණේ. කාට තියෙන සල්ලි ද ඕව හදන්න"
"මේ කැලෙන් වට වෙලා ඉන්න අපට මොන කක්කුස්සිද?"
"ගෙයක් ඇතුළෙ ඉඳගෙනත් ඔය වැඩේ කළ හැකිද?"
"හැම දෙනාම ලැලි දමන හින්දා දැම්ම මිසක් වළක් ඕනැයි කියල මට නම් කල්පනාවක්වත් වුණේ නෑ"
"එළිය ඇතත් නැතත් පාරක් තොටක් අපවිත්‍ර කිරීමට ..... "

(ii) රාජ්‍ය නිලධාරීන් පිළිබඳ ගැමි ආකල්ප
"උන්ට නම් මොකෝ ? ආංඩුවෙන් පඩි කකා කියාවි. ඕං හදපන් නැත්නම් නඩු දානව කියල. දුප්පත් අපි තමයි නැහෙන්නේ"
"නීතියෙන් ගැලවීමට සෞඛ්‍ය පරීක්ෂකටත් අපටත් අවශ්‍ය වූයේ ගොඩනැගිල්ල පමණකි."
"කවර අඩුපාඩුවක් පෙන්නා දෙනු ඇද්දැයි අප විමතියෙන් බලා සිටි අතර......."
"... ඉන්ස්පැක්ටර් කී පරිදි ක්‍රියා නොකළහොත් සිදු විය හැකි කරදර පිළිබඳවය."

05. මුනි සිරිපා සිඹිමින්නේ පදා පන්තියේ දී උපයුක්ත විවිධ කාව්‍යෝපක්‍රම

1. රූපක භාවිතය
   "ජාතිය රන් විමනක් වේ"
   "නිදහස මහ මුහුදක් වේ"

2. අපූර්ව කාව්‍යෝක්ති
   "සිනිඳු මොළොක් බව මලෙහි"

3. අනුප්‍රාසය
   "ජාතික රණ දෙරණ මතේ"

4. එළිසමය හා විරිත
   ඕනෑ ම කවියක් ගෙන එළිසමය ද
   යොන්මත්වැල විරිත ද භාවිත අයුරු

5. රිද්මය - දරු නැළවිලි ගී ලය

06. ධ්වනිතාර්ථවත් පද යෙදීම
   "කුරක්කන් තුනයි වැපිරුවෙ...."
   "එපෙති දෙපෙති මහ හේනේ......."
   සංක්ෂිප්ත ගුණය
   "දුරුතු මහේදී හේනට වැදීලා"
   අපූරු කාව්‍යෝක්ති යෙදීම
   මා කී දේ දෙයියනි ...........

07. සිංහබාහු නාට්‍යයේ ගීතාත්මක බව

(i) සුප්පා දේවියගේ හද වේදනාව ගැයෙන
   "සඟවන්නට බැරිය පුතුගෙන්"

(ii) පියෙකුගේ හද වේදනාව ගැයෙන
   "ගල් ලෙන බිඳලා...."

(iii) තරුණයෙකුගේ අභියෝග භාර ගැනීමේ මනෝ භාවයන් ගැයෙන
   "තුමුල ගතින්දා ...."

අධ්‍යාපන අමාත්‍යාංශය
கல்வி அமைச்சு
Ministry of Education

21 S I, II

අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගය 2023 (2024)
கல்விப் பொதுத் தராதரப் பத்திர (சாதாரண தர)ப் பரீட்சை, 2023 (2024)
General Certificate of Education (Ord.Level) Examination, 2023(2024)

| | | |
|---|---|---|
| සිංහල භාෂාව හා සාහිත්‍යය | I, II | පැය තුනයි |
| சிங்களமொழியும் இலக்கியமும் | I, II | மூன்று மணித்தியாலம் |
| Sinhala Language and Literature | I, II | Three hours |

**අමතර කියවීම් කාලය - මිනිත්තු 10යි**
மேலதிக வாசிப்பு நேரம் - 10 நிமிடங்கள்
Additional Reading Time-10 minutes

අමතර කියවීම් කාලය ප්‍රශ්න පත්‍රය කියවා තෝරා ගැනීමටත් පිළිතුරු ලිවීමේ දී ප්‍රමුඛත්වය දෙන ප්‍රශ්න සංවිධානය කර ගැනීමටත් යොදා ගන්න

## සිංහල භාෂාව හා සාහිත්‍යය I

උපදෙස්:

(i) සියලු ම ප්‍රශ්නවලට උත්තර සපයන්න. මෙම ප්‍රශ්න පත්‍රය සඳහා ලකුණු 40ක් ලැබේ.
(ii) අංක 1 සිට 40 තෙක් ප්‍රශ්නවල, දී ඇති (1), (2), (3), (4) උත්තරවලින් නිවැරදි හෝ වඩාත් ගැළපෙන හෝ උත්තරය තෝරන්න.
(iii) ඔබට සැපයෙන උත්තර පත්‍රයේ එක් එක් ප්‍රශ්නය සඳහා දී ඇති කව අතුරෙන්, ඔබ තෝරා ගත් උත්තරයෙහි අංකයට සැසඳෙන කවය තුළ (x) ලකුණ යොදන්න.
(iv) එම උත්තර පත්‍රයේ පිටුපස දී ඇති අනෙක් උපදෙස් ද සැලකිල්ලෙන් කියවා, ඒවා ද පිළිපදින්න.

- අංක 1 සිට 3 තෙක් ප්‍රශ්නවල එක් එක් වාක්‍යයෙහි **තද කළු අකුරෙන්** මුද්‍රිත කොටසේ අර්ථයට වඩාත් සමීප අර්ථය දෙන උත්තරය තෝරන්න.

1. කලක් **එක පතේ කෑ** ඔවුහු දැන් විරසක ව සිටිති.
   (1) එක් ව ආහාර ගත් (2) එකිනෙකාට උදවු කර ගත්
   (3) ඉතා ළඟින් ඇසුරු කළ (4) කෑම සම ව බෙදා ගෙන කෑ

2. අපිත් **ඉර හඳ දුටු** මිනිස්සු වෙමු.
   (1) යමක් කමක් දන්නා (2) බොහෝ කල් ජීවත් වූ
   (3) කිසිදු දෙයක් නොදන්නා (4) දිවා රෑ දෙකෙහි වෙහෙසෙන

3. පියතුමා අප සැමගේ අභිවෘද්ධිය උදෙසා **ආත්ම පරිත්‍යාගයෙන්** කටයුතු කෙළේ ය.
   (1) අප දිරිගන්වමින් (2) තම යහපත ගැන ම සිතා
   (3) සියලු ධනය වැය කරමින් (4) තම ජීවිතය ගැන නොසලකා

- අංක 4 සිට 6 තෙක් ප්‍රශ්නවල හිස්තැන්වලට වඩාත් සුදුසු පදය තෝරන්න.

4. ආයතනයක ප්‍රතිපාදන සපුරා ගැනීමේ දී ..................... ක්‍රියාවලිය විධිමත් විය යුතු ය.
   (1) ප්‍රවර්ධන (2) ප්‍රසම්පාදන (3) ප්‍රකාශන (4) ප්‍රශස්ත

5. රසිකයන් තුළ රස භාව දැනවීම සඳහා වචන .................... කෙරෙහි කවීහු සැලකිලිමත් වෙති.
   (1) සංයෝජනය (2) සංවිධානය (3) සන්දර්භය (4) සම්බන්ධය

6. ආනන්ද මෛත්‍රේය හිමියෝ ධර්ම සාහිත්‍ය ග්‍රන්ථ තමා විසින් ම ඉගෙනීමෙන් හෙවත් .............................. පෘථුල දැනුමක් අත් කර ගත්හ.
   (1) ස්වීයත්වයෙන් (2) ස්වෝත්සාහයෙන්
   (3) ස්වාධ්‍යයනයෙන් (4) ස්වාධීනත්වයෙන්

7. සෑම පදයක ම අක්ෂර වින්‍යාසය නිවැරදි ව යෙදී ඇති පද පේළිය තෝරන්න.

(1) ස්ථාවර, ඓක්‍යය, ස්වාභාවික, මලල ක්‍රීඩා
(2) ව්‍යායාමය, කල්‍යාණ, ව්‍යංගාර්ථ, ප්‍රසාංගික
(3) කතෘ, ව්‍යූහය, ඇණූ වගාව, පිළිතුරු
(4) අභිරහස්, සමාජයීය, ආධ්‍යාත්මික, සූර්යයා

8. දී ඇති වචනවල, දෙවැනි අකුරෙහි ගයනුකිත්ත, ගැට ඇලපිල්ල, දීර්ඝ පාපිල්ල හා රකාරාංශය පිළිවෙළින් යෙදී ඇති වරණය තෝරන්න.

(1) සාදෘශ්‍යය, සංයුතිය, ඡත්‍රය, පෞරාණික
(2) අලෞකික, සමෘද්ධිය, වෛදූර්ය, චිත්‍රණය
(3) පෘථුල, කෞටිල්‍ය, සුප්‍රකට, අපූර්ව
(4) අබෞද්ධ, විවෘත, අලුයම, මිත්‍රයා

9. ඕෂ්ඨජ, මූර්ධජ හා කණ්ඨජ අක්ෂර පිළිවෙළින් යෙදී ඇති වචන පමණක් ඇති වරණය තෝරන්න.

(1) පාඨක, භාෂක, පරාග (2) මුහුණ, කුහුල, ප්‍රණාම
(3) තරුණ, මුදල, වරුණ (4) ජනිත, මතක, මුළාව

10. අකාරාදි පිළිවෙළ **නිවැරදි ව** දැක්වෙන පද පේළිය තෝරන්න.

(1) වත්තේගම, ඉපලෝගම, අහංගම, හුංගම
(2) අතුරුගිරිය, මිලාගිරිය, බඳගිරිය, සීගිරිය
(3) කිරිබත්ගොඩ, බලංගොඩ, හිඟුරක්ගොඩ, මුදුන්ගොඩ
(4) කොස්ගම, කොස්දෙණිය, කොස්වත්ත, කොස්හේන

11. උක්ත හා අනුක්ත නාම පද දෙක බැගින් ඇතුළත් වරණය තෝරන්න.

(1) කිසිවකු, රජ්ජුරුවෝ, හෙතෙම, මොවුන්
(2) කතක්, අප, සත්වයෝ, බලධාරීහු
(3) ඇතමකු, තිරිසනුන්, වඳුරන්, ඇත්තු
(4) පුතණුවෝ, ශිෂ්‍යාවක, වවුලෝ, ඔවුහු

12. දී ඇති වාක්‍යයෙහි තද කළු අකුරින් මුද්‍රිත වචනයෙහි විභක්තිය ඇතුළත් වරණය තෝරන්න.
මගීහු සියල්ලෝ ම ගමනාන්තයේ දී **දුම්රියෙන්** බැස ගත්හ.

(1) ආධාර (2) සම්බන්ධ (3) කරණ (4) අවධි

13. විශේෂණ, දකාරාර්ථ, අන්‍යාර්ථ හා විභක්ති යන සමාසවලට අයත් පද පිළිවෙළින් දක්වා ඇති වරණය වනුයේ,

(1) නිලුපුල්, මින්දද, මුනිපුද, දරුදැරි
(2) ගිහිපැවිදි, ගුණසයුර, දිගැසි, වේපස්
(3) දෙනුවර, දුකසැප, බරනෙත, මිහිදුම්
(4) කෘමිරෝග, සිහිනිඟ, සියපත්, ඇළදොළ

14. '**කාර්යාලයීය**' යන පදයේ ප්‍රකෘතිය හා ප්‍රත්‍යය වෙන් කළ විට දැක්වෙන නිවැරදි ස්වරූපය කුමක් ද?

(1) කාර්යාල + ඊය (2) කාර්යාලයය + ඊය
(3) කාර්යාලය + යීය (4) කාර්යාලය + ඊය

15. මුලින් දී ඇති ව්‍යාකරණ ප්‍රවර්ගයට අයත් **නොවන** පදයක් සහිත වරණය තෝරන්න.

(1) කෘදන්ත නාම - පිපුණු, කියමන්, ගොඩනැගිලි, වචනු
(2) තද්ධිත නාම - ලබ්ධික, ඉහටි, පිළිමය, වරලස්
(3) සමාස නාම - කිරිදත්, ජනප්‍රිය, දුදන, බටහිර
(4) සර්ව නාම - අපි, නුඹ, ඔවුන්, ඒවා

16. කියාගෙන, ආවොත්, නට නටා, බලග යන ක්‍රියා පද අයත් වර්ගය පිළිවෙළින් දැක්වෙන වරණය තෝරන්න.

(1) පූර්ව ක්‍රියා, අසම්භාව්‍ය ක්‍රියා, මිශ්‍ර ක්‍රියා, විධි ක්‍රියා
(2) මිශ්‍ර ක්‍රියා, පූර්ව ක්‍රියා, අසම්භාව්‍ය ක්‍රියා, විධි ක්‍රියා
(3) පූර්ව ක්‍රියා, මිශ්‍ර ක්‍රියා, විධි ක්‍රියා, අසම්භාව්‍ය ක්‍රියා
(4) අසම්භාව්‍ය ක්‍රියා, විධි ක්‍රියා, පූර්ව ක්‍රියා, මිශ්‍ර ක්‍රියා

- අංක 17 – 19 තෙක් ප්‍රශ්නවල තද කළු අකුරින් මුද්‍රිත කොටසේ අර්ථය නිවැරදි ව දැක්වෙන වරණය තෝරන්න.

17. වාපි සංස්කෘතිය **චිරස්ථායි** වීම ලක්දිව කෘෂිකර්මාන්තයේ අභිවෘද්ධියට හේතු විය.

(1) කලක් තිස්සේ ව්‍යාප්ත ව තිබීම (2) දිගු කලක් ස්ථාවර ව පැවතීම
(3) බොහෝ කාලයක සිට පැවතීම (4) දියුණුවට පත්වීම

18. නර්තන ශිල්පියා වේදිකාව මත **තුදුස් විටක්** කැරකී, උඩ පැන කරණමක් ගසා නරඹන්නන් උත්දාමයට පත් කෙළේ ය.

(1) දාහත් වරක් (2) තිස් දෙවරක්
(3) දහතුන් වරක් (4) දාහතර වරක්

19. සාහිත්‍යකරුවා උපයුක්ත කර ගන්නා භාෂාවේ විශේෂ ලක්ෂණයක් නම් එහි ඇති **භාවික ගුණය යි**.

(1) සැඟවුණ අරුත් පළ කිරීමේ සමත්කම
(2) චිත්තරූප ජනනය කිරීමේ හැකියාව
(3) හැඟීම් දැනවීමේ ශක්තිය
(4) ජීවිතාවබෝධය ලබාදීම

20. දී ඇති වචන ගොනු අතුරෙන් අන්‍යෝන්‍ය වශයෙන් සමීප කාර්යයන් සමඟ බැඳී **නොපවත්නා** පදයක් ද සහිත වරණය තෝරන්න.

(1) ගල්, වැලි, යකඩ, සිමෙන්ති (2) මිටිය, කියත, කුඩය, නියන
(3) බෝංචි, වැටකොළු, ගෝවා, රාබු (4) දොඹ, හොර, මිල්ල, තේක්ක

21. එක් එක් පද පේළියෙහි දක්වා ඇති පදවලට **සමානාර්ථ යෙදුම්** පමණක් ඇතුළත් වරණය තෝරන්න.

(1) දුලබ - දුබල, වක්ත්‍ර - වස්ත්‍ර, පත්‍ර - දලු, කිතු - පැසසුම්
(2) සිනිඳු - සියුමැලි, රිටුන් - කාකයන්, අර්චනීය - පූජනීය, ලෞකික - මෙලෝ
(3) දේව - මුරු, කමල - උපුල්, බ්‍රහ්ම - බඹු, පිරිසිදු - පැහැදිලි
(4) සතුට - ආනන්ද, රිසි - ප්‍රිය, පාදය - සරණ, රන් - රුවන්

22. මුලින් දී ඇති පදයට **සමානාර්ථයක් නොදෙන** පදයක් ඇතුළත් වරණය තෝරන්න.

(1) යහළු - සබඳ, සකි, මිතුරු, සහළාණ
(2) කුකුළු - සැවුල්, කුක්කුට, සරණවි, කදිර
(3) චන්ද්‍රයා - නිසයුරු, උළිඳු, පිනිපා, තරිඳු
(4) ස්ත්‍රිය - මාගම, වමිය, මව, නාරි

23. **විරුද්ධාර්ථවත්** පද යුගලයක් ඇතුළත් **නොවන** වරණය තෝරන්න.

(1) ආකර්ෂණ - විකර්ෂණ (2) සංයුක්ත - නියුක්ත
(3) ප්‍රත්‍යක්ෂ - අනුමාන (4) ප්‍රතිගාමී - ප්‍රගතිශීලී

24. **නිවැරදි** අදහස දෙන ප්‍රකාශය තෝරන්න.

(1) සිංහලයේ අකුරු අනුපිළිවෙළ අක්ෂර වින්‍යාසයයි.
(2) සඤ්ඤක අක්ෂරවලට නාසික්‍ය ශබ්ද නාමය ද යෙදේ.
(3) ඓ, ඖ යන ස්වර සංයුක්තාක්ෂර ලෙස ද හැඳින්වේ.
(4) ස්වරාදේශ සන්ධියේ දී ස්වරයක් ලොප් නොවී අලුතින් ස්වරයක් පැමිණේ.

25. පහත දැක්වෙන වාක්‍ය අතුරෙන් මනා පද ගැළපීමෙන් යුක්ත අර්ථාන්විත වාක්‍ය තෝරන්න.

(1) මිනිසා විශාල වුවත් ජල ප්‍රමාණය භාවිත කරන්නේ අල්ප ප්‍රමාණයකි.
(2) බොහෝ රටවල් ලෝකය හා සැසඳීමේ දී අප රටේ විදුලි බිල අධික ය.
(3) වන සංරක්ෂණයේ දී සතුන්ගේ ව්‍යාප්තියට සහාය දැක්වීම සිදු විය යුතු ය.
(4) කොළඹ කොටස් හුවමාරුව යනු සමාගම් පාලනය කරන ස්වයංනියාමන ආයතනයකි.

- අංක **26 – 27** ප්‍රශ්න යටතේ දක්වා ඇති අදහසට වඩාත් ම ගැළපෙන යෙදුම ඇතුළත් වරණය තෝරන්න.

26. ජන්මයෙන් ලත් දුර්ගුණ ඉවත ලිය නොහැකි වීම

(1) ඇතා වැහැරුණත් කොරහේ නාවන්න බැරුවා සේ
(2) උණ පුරුකේ දැමුවත් බලු වලිගේ ඇද නැරේ
(3) කසළ ගොඩේ තිබුණත් මැණික මැණිකමලු
(4) මහ කකුළුවා ඇදේට යමින් පොඩි කකුළුවන්ට කෙළින් යන්න කියනවා වගේ

27. කරදරයක් පිට තවත් කරදරයක් පැමිණීම

(1) ගහෙන් වැටුණු මිනිහට ගොනා ඇන්නා වගේ
(2) වඳින්න ගිය දේවාලේ හිස මත කඩා වැටුණා සේ
(3) කේලම් කියලා බැණුම් ඇහුවා වගේ
(4) ඇවිලෙන ගින්නට පිදුරු දැම්මා වගේ

28. ස්වරාදේශ, ද්විත්වරූප හා ආගම යන සන්ධිවලට අදාළ නිදසුන් පිළිවෙළින් දැක්වෙන වරණය තෝරන්න.

(1) කොස්සැට, කටුවල, වීරෝදාර
(2) බත්තුළු, දැහිලි, දෙවුර
(3) ගෙවුයන්, පොල්ලත්ත, වටොර
(4) දැගසවු, පත්තිරු, සිවුරඟ

- අංක 29-30 යටතේ දක්වා ඇති එක් එක් ප්‍රශ්නවල **ව්‍යාකරණානුකූල ව නිවැරදි** වාක්‍යය තෝරන්න.

29. (1) පුතණුවන් නිවසින් පිටත් ව විදු බිමට ගියේ ය.
(2) අම්මාත් නංගීත් පෙරහැර බැලීමට නුවර ගියා ය.
(3) අප විභාගයට හොඳින් මුහුණු දෙති'යි දෙමවුපියෝ අපේක්ෂා කරති.
(4) යහපත් දෙමවුපියෝ විසින් දරුවෝ යහ මඟ යැවෙති.

30. (1) සියලු දේශපාලන පක්ෂ ජනාධිපතිවරණයට සැරසෙති.
(2) සමූහ ගීත ගායනය සඳහා බාලිකාවන් වේදිකාවට පැමිණ ඇත.
(3) පාසල් ශිෂ්‍යයෝ විනය ගරුක විය යුතු ය.
(4) ගස්වැල් සැඩ සුළඟින් ඉදිරී වැටුණාහ.

31. * වෙළෙන්දෝ අධික ලාභය ...................... පාරිභෝගිකයන් පීඩාවට පත් කරති.
* ගංවතුර බැස යැමෙන් පසු අවතැන් වූ ජනයා ......................... නිවෙස් කරා ගියහ.
* මවුවරු සිය දරුවන් ද .................................. වෛද්‍ය සායනයට පැමිණ සිටිති.
* රෑ බෝ වී ඇති ........................ සෞඛ්‍ය පරීක්ෂකවරයා යාබද ගමට යෑම කල් දැමී ය.

ඉහත වාක්‍යවල හිස්තැන් පිරවීම සඳහා වඩාත් යෝග්‍ය නිපාත පද අනුපිළිවෙළ කුමක් ද?
(1) බැවින්, යළි, තකා, කැටුව
(2) තකා, යළි, කැටුව, බැවින්
(3) කැටුව, බැවින්, යළි, තකා
(4) තකා, කැටුව, යළි, බැවින්

32. පහත දැක්වෙන වාක්‍යය ලේඛන ව්‍යවහාරයට හැරවූ විට වඩාත් නිවැරදි වන්නේ කුමක් ද?
"අඳුනන්නෙ නැති කවුරුහරි දැක්කහම සුනඛයෝ බුරන්න පටන් ගන්නවා"
(1) නාඳුනන කෙනෙකු දුටු විට සුනඛයෝ බිරීමට පටන් ගනිති.
(2) නාඳුනන කිසිවෙක් දකින විට සුනඛයන් බුරන්න පටන් ගනිති.
(3) කවුරුන් හෝ දුටු විට නාඳුනන සුනඛයෝ බුරන්නට පටන් ගනී.
(4) නොහඳුනන කෙනෙක් ආවොත් සුනඛයෝ එක දිගට බුරන්නට සැරසෙති.

33. **කෝ වේයකට** යනුවෙන් හඳුන්වන්නේ
(1) කුඩා වියට (2) කෝප වේගයට
(3) කොපමණ වෙහෙසකට (4) කුඩා වීදියකට

34. පහත සඳහන් කවියේ සිවුවන පදය නිවැරදි ව දැක්වෙන වරණය තෝරන්න.

එවන් ලෙයින් උපන් පුතේ
සුරු විරුකම් ඔබට ඇතේ
දෑ උරුමය ඇති ව සිතේ
..........................................

(1) ඔබ පොළොවට බරකි පුතේ (2) මවුබිම දෙස බලන් පුතේ
(3) ඉදි කළ වැව් බලන් පුතේ (4) පෙර විරුවන් ඔබගෙ පුතේ

35. පාලි සංස්කෘත ආදි භාෂාවන්ගෙන් බිඳ සිංහලයට ගැළපෙන සේ සකස් කරගත් වදන් සඳහා වඩාත් සුදුසු යෙදුම වන්නේ
(1) තත්සම වචන (2) නිෂ්පන්න වචන (3) තද්භව වචන (4) සෘණීකෘත වචන

36. උපමාවක් හා රූපකයක් ඇතුළත් වන වරණය තෝරන්න.
(1) නරමුල් ඇඟ ඇට කිඹුලකු වැන්නේ
(2) බැඳ හළ රතු ගලක් ලෙස සඳ වෙලෙන වට
(3) සොබමන් සුනිල් මිණි නිල් නුබ තුර විපුල
(4) නිසි පුළුලුකුල රිය සක'යුරු තිසර තන

37. පොදු ව්‍යවහාරයේ ‘මහුල් කපුවා’, ‘පිරිමි ළමයා’ හා ‘අලි අල්ලන පුද්ගලයා’ යන යෙදුම් සඳහා ප්‍රාදේශීය උපභාෂාවන්හි යෙදී ඇති පද පිළිවෙළින් දැක්වෙන වරණය තෝරන්න.

(1) කුඩහලුවා, පනික්කලයා, කේලම්කාරයා (2) කේලම්කාරයා, කුඩහලුවා, පනික්කලයා
(3) පනික්කලයා, කේලම්කාරයා, කුඩහලුවා (4) කේලම්කාරයා, පනික්කලයා, කුඩහලුවා

38. ‘වතුර මල’, ‘තල මල පිපිලා’, ‘මං තනන්නෝ’, ‘වහල්ලු’ යන සාහිත්‍ය නිර්මාණයන්හි රචකයන්ගේ නම් පිළිවෙළින් දැක්වෙන වරණය තෝරන්න.

(1) ඇරැව්වල නන්දිමිත්‍ර, මහගම සේකර, ජයලත් මනෝරත්න, මාර්ටින් වික්‍රමසිංහ
(2) මාර්ටින් වික්‍රමසිංහ, ඇරැව්වල නන්දිමිත්‍ර, ජයලත් මනෝරත්න, මහගම සේකර
(3) මහගම සේකර, මාර්ටින් වික්‍රමසිංහ, ජයලත් මනෝරත්න, ඇරැව්වල නන්දිමිත්‍ර
(4) ඇරැව්වල නන්දිමිත්‍ර, ජයලත් මනෝරත්න, මහගම සේකර, මාර්ටින් වික්‍රමසිංහ

39. පහත සඳහන් කවියේ අර්ථයට වඩා සමීප අර්ථය දෙන වරණය තෝරන්න.

සුසිරිත මිසක දුසිරිත කිසි තැනෙක නැත
රිසි වන සියලු යසිසුරු රිසි ලෙස ම ඇත
නිසි කල වැසි ද සස් පල නැගි නැගී ගත
මෙසියල් සැපෙන් සිරිලක ලෝ මුදුන් පත

(1) සුසිරිත් හා යස ඉසුරින් බර මේ ලක් දිවයින හැම කලට වැසි ලබන නිසා උතුම් රටක් බවට පත් වෙයි.
(2) සියලු සැප සම්පතින් ආඪ්‍ය වූ මේ දිවයින ලොව අගතැන් ලබන්නේ දුසිරිතෙන් තොර වූ සුචරිතයෙහි යෙදෙන ජනයා නිසා ය.
(3) සශ්‍රීකත්වය අනූන සුසිරිත් හා යස ඉසුරු ඇති නිසි කලට වැසි ලැබ ශස්‍ය ඵල දරන මේ ලක්බිම මුළු ලෝකයට අගතැන් ගෙන සිටී.
(4) කැමති සියලු යස ඉසුරු විඳිමින් නිසි කලට පූදින ශස්‍ය ඵල අනුභව කරමින් සුසිරිත් වඩන ජනයා මේ ලක්දිව සිටිති.

40. දී ඇති පාඨයේ අර්ථයට වඩා සමීප අර්ථය දෙන වරණය තෝරන්න.

“ගෘහ නිර්මාණ ශිල්පියාගේ නිර්මාණ සැලසුමට අනුව ගොඩනැගිල්ලක් තැනීමට වාස්තු විද්‍යාඥයා උපදෙස් දෙන්නා සේ නාට්‍ය නිෂ්පාදනය කිරීමට නාට්‍ය අධ්‍යක්ෂවරයා උපයෝගී කර ගන්නේ රචකයා පිළියෙල කළ නාට්‍ය පිටපතයි”

(1) ගොඩනැගිල්ලක් තැනීමට වාස්තු විද්‍යාඥයා උපදෙස් දෙන්නේ ගෘහ නිර්මාණ ශිල්පියා විසින් නිර්මාණය කරනු ලැබූ ගෘහ නිර්මාණ සැලසුමට අනුව සේ නාට්‍ය අධ්‍යක්ෂවරයා ද නාට්‍ය නිෂ්පාදනයට උපයෝගී කර ගන්නේ රචකයා විධිමත් ව පිළියෙල කළ නාට්‍ය පිටපතයි.

(2) ගෘහ නිර්මාණ ශිල්පියා ගොඩනැගිල්ල තැනීමට උපදෙස් දෙන්නේ වාස්තු විද්‍යාඥයාට අනුව බැවින් නාට්‍ය අධ්‍යක්ෂවරයා ද රචකයා පිළියෙල කළ පිටපතට අනුව නාට්‍ය නිෂ්පාදනය කරයි.

(3) වාස්තු විද්‍යාඥයකු ගෘහ නිර්මාණ ශිල්පියාට ගොඩනැගිල්ල තැනීමට උපදෙස් දෙන්නේ නිර්මාණ සැලසුමට අනුව බැවින් නාට්‍ය නිෂ්පාදකයා ද නාට්‍ය අධ්‍යක්ෂකගේ උපදෙස් අනුව නාට්‍ය පිටපත උපයෝගී කර ගනී.

(4) ගොඩනැගිල්ලක් තැනීමට ගෘහ නිර්මාණ ශිල්පියා උපදෙස් දෙන්නේ වාස්තු විද්‍යාඥයා නිර්මාණය කළ සැලසුමට අනුව සේ, නාට්‍ය අධ්‍යක්ෂවරයා ද නාට්‍ය නිෂ්පාදකට පිටපත අනුව එය පිළියෙල කිරීමට උපදෙස් දෙයි.

***